# සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
# சமுர்த்தி அபிவிருத்தி திணைக்களம்
# Department of Samurdhi Development

මුදල් අමාත්‍යාංශය
සමෘද්ධි , ගෘහ ආර්ථික , ක්ෂුද්‍ර මූල්‍ය , ස්වයං රැකියා හා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය
நிதி அமைச்சு
சமுர்த்தி, வதிவிடப் பொருளாதார,நுண்நிதிய, சுயதொழில்,மற்றும் வியாபார அபிவிருத்தி இராஜாங்க அமைச்சு
Ministry of Finance
State Ministry of Samurdhi, Household Economy, Micro Finance, Self Employment and Business Development


මගේ අංකය / எனது இல / My No: DSD/HO/02/Ad/01/cadre

ඔබේ අංකය / உமது இல / Your No: ..........................................

දිනය / திகதி / Date: 2021.04.06

සියළුම දිස්ත්‍රික් ලේකම්/ දිස්ත්‍රික් සමෘද්ධි අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරුන්,

දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂවරුන්,

ප්‍රාදේශීය ලේකම්වරුන්,

නියෝජ්‍ය අධ්‍යක්ෂ/ සහකාර අධ්‍යක්ෂවරුන් වෙත

**<u>සංවර්ධන නිලධාරි සේවයේ III ශ්‍රේණියේ තනතුරු සඳහා පත් කිරීම 2021</u>**

ඉහත සඳහන් කරුණ සම්බන්ධයෙන් මා විසින් ඔබ වෙත යොමු කරන ලද මගේ සමාංක හා 2021.03.29 හා 2021.03.31 දිනැති ලිපි හා බැඳේ.

02. එම ලිපි මඟින් උපදෙස් දී ඇති පරිදි ඔබ දිස්ත්‍රික්කයට අනුයුක්ත කර ඇති මෙම නිලධාරින් අ.ම.ප/20/1323/304/018 හා 2020.10.05 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය හා රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්ගේ අංක PSC/EST/03-05/03/2019 දරණ 2020.11.12 හා 2021.01.08 දිනැති රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණ අනුව පෙර පැවති මුදල්/ ආර්ථික හා ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශය යටතේ පැවති ආර්ථික හා ප්‍රතිපත්ති සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය මඟින් 2019 වර්ෂයේ බඳවා ගන්නා ලදුව වසරක පුහුණුව සම්පූර්ණ කිරීමෙන් පසු 2021.01.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි සංවර්ධන නිලධාරි සේවයේ III ශ්‍රේණියේ තනතුරු සඳහා පත්කර ඇති නිලධාරින් වේ.

03. මෙම නිලධාරින් පත්කිරීම සම්බන්ධයෙන් ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ CS/DOS/POLICY/01/01(II) හා 2021.03.26 දිනැති ලිපියෙන් ලබාදී ඇති උපදෙස් අනුව නව තනතුරු ඇති කර ගැනීම සඳහා කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත කඩිනමින් යොමු කිරීමට කටයුතු කරමින් පවතී.


1වන අදියර,4 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල. /1ம் கட்டம், 4 வது மாடி,செத்சிறிபாய பத்தரமுல்ல /1st Step, 4 th floor, Sethsiripaya Battaramu

| | අධ්‍යක්ෂ ජනරාල් / பணிப்பாளர் தலைமையதிபதி / Director General | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පාලන හා ආයතන) / மேலதிக பணிப்பாளர் தலைமையதிபதி ( நிர்வாகம்/தாபனம்) / Additional Director General (Admin & Establishment) | ප්‍රධාන ගණකාධිකාරී / பிரதான கணக்காளர் / Chief Accountant | අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය) / பணிப்பாளர் (குறு நிதி ) / Director ( Micro Finance) | කාර්යාලය / அலுவலகம் / Office |
|---|---|---|---|---|---|
| Tel- | 011-2872202 | 011-2873799 | 011-2869742 | 011-2889003 | 0112872202 |
| Fax - | 011-2889002 | 011-2873996 | 011-2869742 | 011-2887469 | |
| E-mail- | dg@samurdhi.gov.lk | diradmin@samurdhi.gov.lk | finance@samurdhi.gov.lk | | |
| | | Hot Line :0112-889007 | | Hot Line:0112-885582 | Hot Line: 011- 288 |

04. මෙම නිලධාරීන් පත්කර ඇත්තේ 2021.01.01 දිනසිට ක්‍රියාත්මක වන පරිදි වන බැවින් ඔවුන් 2021.01.01 දිනසිට සංවර්ධන නිලධාරි සේවයේ III ශ්‍රේණියේ තනතුරෙහි රාජකාරි භාරගත් සේ සලකා එදින සිට අදාල වැටුප් ගෙවිය යුතු බවත් 2021.01.01 සිට ඔවුන්ගේ පූර්ව සේවා ස්ථානයේ ගෙවන ලද අභ්‍යාසලාභී දීමනා හෝ වැටුප් පිළිබඳ තහවුරු කරගෙන ඒ සමඟ ගලපා හිඟ වැටුප් පමණක් අදාල රෙගුලාසි වලට අනුකූලව ගෙවීම් කිරීමට වග බලාගන්නා ලෙසද දන්වා ඇත.

05. එමෙන්ම මෙම නිලධාරීන් ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් යටතේ සංවර්ධන නිලධාරි සේවා ව්‍යවස්ථාවෙන් පාලනය වන නිලධාරීන් වේ. එමනිසා දැනට දෙපාර්තමේන්තුගත තනතුරු ලෙස අනුමත කරගැනීම සඳහා කළමණාකරණසේවා දෙපාර්තමේන්තුව වෙත යොමුකර ඇති තනතුරුවලට මෙම තනතුරු වලින් කිසිදු බලපෑමක් නොවන බව සඳහන් කරමි.

06. ඒ අනුව මෙම නිලධාරීන් දැනට අනුයුක්ත කරඇති විගණන ඒකකවල අවශ්‍ය මූලික පහසුකම් සලසන ලෙසත්, ඉදිරියේදී ඔවුන් වෙත ස්ථිරව පැවරිය යුතු රාජකාරි පිළිබඳව විශේෂ පුහුණු වැඩමුළුවලදී දැනුම්දීමට කටයුතු කරන බවත්, එතෙක් මෙම දෙපාර්තමේන්තුවේ කාර්යභාරය පිළිබඳව මූලික පුහුණුවීම් දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් සුදුසු පරිදි ලබාදීමට අවශ්‍ය කටයුතු කරන ලෙසත් වැඩිදුරටත් කාරුණිකව දන්වා සිටිමි.

ආර්.පී.බී.තිලකසිරි,
අධ්‍යක්ෂ ජනරාල්

පිටපත්,

01. ලේකම්, සමෘද්ධි, ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා හා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය - කාරු.දැ.ගැ.ස.
02. විගණකාධිපති - කාරු.දැ.ගැ.ස.
03. ප්‍රධාන ගණකාධිකාරි - කාරු.දැ.ගැ.ස
04. ප්‍රධාන අභ්‍යන්තර විගණක - කාරු.දැ.ගැ.ස
05. සියළුම වෘත්තීය සමිති ලේකම්වරුන් - කාරු.දැ.ගැ.ස